**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය - 2015**

-----------------------------------------------------------------

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

---

2.1 **තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම නිසා පිරිවැය රු.22,286,717 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

---

අබලි භාණ්ඩ ලෙස 2011 හා 2014 වර්ෂවලදී හඳුනාගත් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පරිගණක හා උපාංග 06 ක පිරිවැය වූ රු. 472,340 ක් හා ක්ෂය වෙන්කිරීම් දෙවතාවක් ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

2.2.3 **පැහැදිලි නොකළ වෙනස්කම්**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ලීබඩු හා කාර්යාල උපකරණ සහ පරිගණක හා මුද්‍රණ යන්ත්‍රවලට අදාළ පිරිවැය හා ක්ෂය අගයන් උපලේඛන සමඟ සැසැඳීමේදී පිළිවෙලින් රු.458,907 ක හා රු. 558,376 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

වටිනාකම රු. 18,372,855 ක් වූ ජර්නල් වවුචර්වලට අදාල උපයෝගී ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

2.3 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| (අ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ අවශ්‍යතා සපුරාලන පරිදි මෘදුකාංග සම්බන්ධ ලේඛන නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2014 ඔක්තෝබර් 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2014 (V) හා (VI) ඡේද | 2015 දෙසැම්බර් 31 දිනට වූ භාණ්ඩ සමීක්ෂණයේදී පාවිච්චි කළ නොහැකි ලෙස හඳුනාගත් ස්ථාවර වත්කම් 25 ක් ඇතුළු භාණ්ඩ 35 ක් ඉවත්කිරීම සම්බන්ධයෙන් කටයුතු අවසන් කර 2016 මාර්තු 17 දිනට පෙර එම වාර්තා ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය. | 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සැපයුම්කරුවන් 9 දෙනෙකු වෙත ගෙවා තිබූ රු.118,438 ක් වූ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වාර්තා විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

--------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.14,850 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.985,307 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,000,157 ක වර්ධනයක් සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන ඇතුලු සේවක ප්‍රතිලාභ හා අනිකුත් වියදම් රු.2,327,372 කින් වර්ධනය වී තිබු නමුත් රාජ්‍ය ආයතනවලින් ලද මුදල් හා පුනරාවර්තන ප්‍රදාන රු.3,409,690 ක් වර්ධනය වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ඌනතාවයක් පැවති නමුත් 2015 වර්ෂයේ දී අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැළැකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.7,922,814 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.16,425,692 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

4.1 **කාර්යසාධනය**

----------------

ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය 2(GEP–2) (1994- 2002) යටතේ පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා බඳවාගත් පුස්තකාලාධිපතීන් හා එම පාසල්වල ගුරු පුස්තකාලාධිපතීන් සඳහා අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීම ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ අරමුණ වේ.

පාඨමාලා පැවැත්වීම සම්බන්ධ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගුරු පුස්තකාලාධිපතිවරුන්ගේ බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට ගුරු පුස්තකාලාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති (MTL) හා ගුරු පුස්තකාලාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) අදාල සුදුසුකම් ඇතුළත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබු නමුත් ගුරු සේවා ව්‍යවස්ථාවට එය ඇතුළත් නොකිරීම හේතුවෙන් එම පාඨමාලා සඳහා ඉල්ලුම අවම වී තිබුණි.

(ආ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 4 (අ) සහ (ඇ) වගන්ති ප්‍රකාරව පාඨමාලා සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හා ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි , අභිඥාන පත්‍ර, සහතික පත්‍ර , හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීමේ දී කොමිෂන් සභාවේ එකඟත්වය ලබාගත යුතු වුවත් එලෙස අනුමැතිය ලබා නොගෙන 2003 ආරම්භක වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා වසර 13 කාලය තුළ පශ්චාත් උපාධි පාඨමාලා වාර 39 ක්ද, ඩිප්ලෝමා පාඨමාලා වාර 18 ක්ද, සහතික පත්‍ර පාඨමාලා වාර 34 ක්ද , වශයෙන් පාඨමාලා වාර 91 ක් පවත්වාගෙන යමින් තිබුණි.

(ඇ) ආයතනය පාඨමාලා පැවැත්වූ වාර ගණනින් සියයට 37ක්ම සහතික පත්‍ර පාඨමාලා වීමෙන් හා 2015 වර්ෂයට ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාවෙන් සියයට 42 ක් සහතික පත්‍ර පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන් වීමෙන් ආයතනය කෙටිකාලීන පාඨමාලාවලට වැඩි දායකත්වයක් ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දක්වා වසරක කාලය තුළ පැවැත්වූ පාඨමාලා සඳහා සහභාගි වූ මුළු සිසුන් ගණන 293 ක් වූ නමුත් සහතිකපත් ලබාදී තිබුණේ සිසුන් 56 දෙනෙකු සඳහා පමණි.

(ඉ) 2007 හා 2011 වර්ෂයන් හිදි ආරම්භ කරන ලද දර්ශනපති/ දර්ශන ශූරී 2007/2010 හා 2011/2014 තුන් අවුරුදු පාඨමාලා ආරම්භකර 2015 වර්ෂය වන විට පිළිවෙලින් වසර 9 ක් හා වසර 5 ක් ගතවී ඇතත් පාඨමාලාව අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS – FT) පාඨමාලාව 2013/2015 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ සිසුන් 4 දෙනාගෙන් එක් අයෙකු පමණක් පාඨමාලාව අවසන්කර සහතිකපත් ලබාගෙන තිබුණි.

(උ) 1991 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 12(6) වගන්තිය යටතේ 2015 වර්ෂයේදී ශාස්ත්‍රීය කමිටු රැස්වීම් වාර 9 ක් පවත්වා තිබූ අතර නියමාවලියේ 12 (1) (ඇ) සහ (ඉ) වගන්ති යටතේ කමිටු සාමාජිකයන් කමිටු රැස්වීම් සඳහා සහභාගීවීම පිළිබඳව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පනත යටතේ පිහිටුවනු ලැබුවා වූ හෝ පිහිටුවන ලදැයි සළකනු ලබන්නා වූ විශ්වවිද්‍යාලවල එක් එක් පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයේ ප්‍රධානියා නියමාවලියේ 12(1) ඇ වගන්තිය යටතේ නම්කරනු ලැබ තිබුණද වර්ෂය තුළදී කිසිදු කමිටු රැස්වීම් වාරයක් සඳහා හෝ සහභාගී වී නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සංගමයේ නියෝජිතයකු නියමාවලියේ 12(1) (ඉ) වගන්තිය යටතේ නම්කරනු ලැබ තිබුණද වර්ෂය තුළදී එක් කමිටු රැස්වීම් වාරයක් සඳහා පමණක් සහභාගිවී තිබුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ සහ බඩු වට්ටෝරු පොත්වල පරිගණක හා පරිගණක උපාංග වෙන වෙනම හඳුනාගත හැකි පරිදි දක්වා නොතිබීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව 2015 දෙසැම්බර් 31 දිනට දක්වන භෞතික ශේෂය සමඟ සැසඳීමට නොහැකි විය.

(ආ) 2014 සැප්තැම්බර් මස රු.107,500 ක් වටිනා ගිණුම්කරණ පැකේජයක් ගිණුම්කරණ කටයුතු පහසු වීම සඳහා මිලදීගෙන තිබුණි. නමුත් ආයතනයේ අවශ්‍යතාවය නිසිලෙස හඳුනානොගෙන පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම හේතුවෙන් ජර්නල් සටහන් පරිගණක මෘදුකාංග පද්ධතිය හරහා මුද්‍රණය කිරීමේදී බොහොමයක් ජර්නල් සටහන්වල එකතුව නිවැරදි නොවීම,හර හා බැර ශේෂ අසමාන වීම, අසම්පූර්ණ වී මුද්‍රණය වීම ආදී දෝෂ නිරීක්ෂණය විය. මේ හේතුවෙන් මෘදුකාංග පද්ධතිය තුළින් බලාපොරොත්තු වූ කාර්ය ඉටුවී නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා පරිගණක උපාංගවල පිරිවැය හඳුනාගත නොහැකිවීම. |
| | (ii) පරිගණක උපාංගයක් අපහරණය කිරීමේදී ඒ සමග දැනට භාවිතා කරන එම පරිගණකවල අනෙකුත් උපාංග සියල්ලම ඉවත්කිරීම. |
| | (iii) ස්ථාවර වත්කම් ලේඛනය ගිණුම් සමඟ නොගැලපීම. |
| (ආ) ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු පාලනය | (i) පුස්තකාල තැන්පතු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| | (ii) ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු ලේඛනයේ හා උපලේඛනයේ තැන්පතු වටිනාකම් අතර වෙනස්කම් පැවතීම. |
| | (iii) ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු උප ලේඛනය ගිණුම් සමඟ නොගැලපීම. |